දළ සංඛ්‍යාලේඛන ගත් විට, ලෝකයේ 15% ක් පමණ යම් කිසි ආකාරයක ආබාධයන් සමගින් ජීවත් වන බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්ත ඔස්සේ දැක්වේ. මෙවැනි ආබාධ සහිතව ජීවත් වන්නවුන්ටද සමාජයේ ඕනෑම අයෙකුට මෙන් වෙනස්කමකට මුහුණ නොපාමින් ජීවත් වීමට හැකියාව ලබාදීමත්, එම පුද්ගලයන් සම්බන්ධයෙන් සහකම්පනය දැක්වීමත් සමාජයක් ලෙසින් අප සියලු දෙනාගේ වගකීමකි. ඔවුන් පිළිබඳව වාර්තා කිරීමේදී පවා එය වෙනස් නොවේ.

යම් පුවත් වාර්තාවකට යම් අයෙකුගේ ආබාධ සහිත බව සෘජුව අදාළ වන්නේ නම් විනා එය සඳහන් කිරීම අවශ්‍ය නොවේ. එසේම ආබාධ සහිත වූවන් හැඳින්වීම සඳහා ආබාධය නොව පුද්ගලයාව මුල් කොට ගත් භාෂාවක් (Person-first language) යොදාගැනීම වඩාත් යෝග්‍ය බව ජාත්‍යන්තර මාර්ගෝපදේශනයන්හි දැක්වේ. ඒ අනුව ගත් විට "ආබාධිත" වැනි යෙදුමකට වඩා වඩාත් යෝග්‍ය වන්නේ "ආබාධ සහිත" වැනි යෙදුමක් බව කීමට හැක.

මූලාශ්‍ර:

https://www.who.int/docs/default-source/documents/disability/world-report-on-disability-factsheet.pdf?sfvrsn=2a22ed1e_2

http://www.disability.wa.gov.au/Global/Publications/Understanding%20disability/words_that_work_media_guide.pdf

https://adata.org/factsheet/ADANN-writing

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima